# Abstract No 50

## අර්හත්හු විමුක්තහු ද?
## (ථෙරවාද හා මහායාන මූලාශ්‍රය ඇසුරින් කෙරෙන විමසීමක්)

**ඕපනායක උපේක්ෂා ධම්මධීරා මෙහෙණිය**
කථිකාචාර්ය (ආධුනික), පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය,
o.u.dhammadheera@gmail.com,

ථෙරවාද හා මහායාන සම්ප්‍රදායයන්හි අනන්‍යතාව විදහා දක්වන ප්‍රමුඛ දාර්ශනික ප්‍රස්තුතයක් ලෙස 'අර්හත්වය' හැඳින්විය හැකි ය. මෙකී සම්ප්‍රදායද්වය හීනයාන හා මහායාන නමින් හැඳින්වීමට ද පාදක වූයේ මෙයයි. ඒ අනුව පරම නිෂ්ඨාව හෙවත් විමුක්තිය සාක්ෂාත් කිරීමෙහි ලා ඒකායන මාර්ගය 'බුද්ධයානය'හෙවත් සම්බුද්ධත්වයට පත්වීම බව අවධාරණය කළ පිරිස'බුද්ධයාන'හෙවත්'මහායාන'ලෙස හඳුන්වනු ලැබේ. 'හීනයාන'වූයේ සම්බුද්ධත්වයට අමතර ව ප්‍රත්‍යෙක බුද්ධ හා ශ්‍රාවක බුද්ධ හෙවත් ශ්‍රාවකයානයෙන් ද විමුක්තිය සාක්ෂාත් කළ හැකියැයි පිළිගත් පිරිසයි.'ථෙරවාද'යනු ද ඊට පර්යාය පදයකි. මජ්ඣිම නිකාය අලගද්දූපම සූත්‍රයෙහි ත්‍රිවිධ සංයෝජනයන් දුරු කරන භික්ෂුව සම්බුද්ධත්වයෙන් කෙළවර වන බව සඳහන් වන අතර අංගුත්තර නිකායෙහි සඳහන් වන්නේ බුදුවරයන් දෙදෙනෙකු ගැන පමණි. ථෙරගාථා අට්ඨකථාවේ බුද්ධත්වය ත්‍රිප්‍රභේද කොට දක්වා තිබේ. මෙසේ බුද්ධ, බෝධිභායාන ආදී නම් ඔස්සේ ථෙරවාදය තුළ ද අර්හත්වයෙන් විමුක්තිය ලැබීම හෙවත් ශ්‍රාවකයානය පිළිබඳ ව කරුණු දක්වා තිබෙනු පෙළ හා අටුවා විමසීමෙන් පෙනේ. මහායානය ද මූලික මහායාන සූත්‍රයක් වන අෂ්ටසාහස්‍රිකා ප්‍රඥාපාරමිතා සූත්‍රයෙහි'භූමි'නමින් ද සද්ධර්මපුණ්ඩරික සූත්‍රයෙහි'යාන'ලෙසින් ද ආදී වශයෙන් විවිධ අවස්ථාවන්හි විවිධාකාරයෙන් මේ පිළිබඳ ව අදහස් දක්වා තිබෙනු දැකිය හැකි ය. සද්ධර්මපුණ්ඩරික සූත්‍රයෙහි රහතන්වහන්සේලාගේ මුවට ම නංවමින් අර්හත්වයේ අර්ධ පූර්ණත්වය විග්‍රහ කළද ඇතැම් තැනක අර්හත්වයෙන් විමුක්තිය සාක්ෂාත් කරණය කළ හැකි බව ගම්‍යවන අවස්ථා ද මහායාන ධර්ම ග්‍රන්ථයන්ගෙන් සපයාගත හැකි ය. මෙසේ ථෙරවාද හා මහායාන ධර්ම ග්‍රන්ථයන්හි අර්හත්වය සහ විමුක්ති සාක්ෂාත් කරණය පිළිබඳ ව විවිධ අදහස් මතවාද අන්තර්ගත ව තිබේ. එකී අදහස් හා මතවාද එකිනෙක ධර්මානුකූල ව සසඳමින් අර්හත්වයට පත්වූවෝ පූර්ණ විමුක්තිගාමීහු ද යන්න පිළිබඳ ගවේෂණය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් සිදු කරනු ලැබේ.

**ප්‍රමුඛපදඃ** යානසංකල්පය, ශ්‍රාවකබෝධිය, නවධර්ම, අට්ඨකථා, විමුක්තිසාක්ෂාත්කරණය